**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නර්තනය - 10 ශ්‍රේණිය / පළමුවන වාරය**

**සැකසුම - දැරණියගල අධ්‍යාපන කොට්ඨාසය / දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

## රබන් නර්තනය නිර්මාණය කිරීම.

**කාර්ය පත්‍රිකාව**

1. ඔබට හැකිනම් රබානක් සපයාගන්න. නැතිනම්, ඔබ අතෙහි රබානක් ඇති බවට උපකල්පනය කරන්න.
2. ඔබ උගත් රබන් කවියක් තෝරාගන්න.
3. තෝරාගත් රබන් කවිය නිවැරදි නාද මාලාව අනුව ගායනා කරන්න.
4. ඔබ සතුව රබානක් ඇත්නම් එය වාදනය කරමින් කවිය ගායනා කරන්න.
5. අන්තර්ජාලය භාවිත කරමින් රබන් නර්තනයක වීඩියෝ පටයක් නැරඹීමට යොමුවන්න.
6. ගායනා කරන ලද කවියේ තිත් රූපයට අනුව, ඔබ ඉගෙනගත් ගොඩ සරඹ හෝ අලංකාර පද ඇසුරින් සරල පද 4 ක් නිර්මාණය කරන්න.
7. පෙර නැරඹූ නර්තනයේ ඇති නිර්මාණාත්මක පද සමඟ ඔබ නිර්මාණය කළ අලංකාර පද යොදා ගනිමින් රබන් නර්තනය නිර්මාණය කරන්න.
8. රබන් නැටුමෙහි සුවිශේෂී ලක්ෂණ ඉස්මතු වන පරිදි උචිත ක්‍රියාකාරකම් තෝරාගන්න.

   උදා : - රබාන කරකැවීම.

   - රබාන ඉහළට දැමීම ආදී ක්‍රියාකාරකම් යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න.
9. රබාන නිවැරදිව හසුරුවමින් නිර්මාණය කරගත් පද කොටස් ගායනය සහිතව නර්තනයේ යෙදෙන්න.
10. අවකාශ භාවිතය සැලකිල්ලට ගෙන නර්තන අංගයෙහි අලංකාරය තීව්‍ර කරගන්න.
11. නිර්මාණය කරන ලද නර්තනය හොඳින් පුහුණුවන්න.

කේ. ඩී. එල්. ඩී. ඉන්ද්‍රශාරී
කෑ/දෙහි/දෙමැද ක. වි.